පොදු චක්‍රලේඛ අංක: 01 - 60 / 2019

*මගේ අංකය :- එච්පී/ඩීපී/16/2019*
*කළමනාකරණ සංවර්ධන හා සැලසුම් ඒකකය*
*සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය*
*කොළඹ 10*

2019 දෙසැම්බර් මස .15.......

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්
නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරුන්
විශේෂිත වැඩසටහන්වල ප්‍රධානීන්
සියළුම සෞඛ්‍ය සේවා ආයතන / රෝහල් ප්‍රධානීන්

**පානදුර කේතුමතී රෝහල නැවත වර්ගීකරණය කිරීම සහ**
**එය ස්වාධීන ආයතනයක් ලෙස ක්‍රියා කිරීම**

පානදුර මූලික රෝහලේ නාරි හා ප්‍රසව ඒකකය කේතුමතී නමින් වෙනම පිහිටි ගොඩනැගිල්ලක බස්නාහිර පළාත් සභාව යටතේ ක්‍රියාත්මක වේ. ඉහල ගුණාත්මක හා කාර්යක්ෂම මාතෘ හා නව ජන්ම සෞඛ්‍ය සේවාවන් සැපයීම සඳහා කරන ලද ඉල්ලීම් සලකා බලා මෙම ඒකකය ස්වාධීන ආයතනයක් ලෙස ස්ථාපිත කිරීම සහ එම ආයතනය කේතුමතී කාන්තා රෝහල ලෙස නම් කිරීමට බස්නාහිර පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලය 2018.06.05 දින පැවති එහි 122 වැනි රැස්වීමේදී තීරණය කර ඇත.

මේ සම්බන්ධයෙන් සියළු සාධක සලකා බලමින්, කේතුමතී කාන්තා රෝහල විශේෂ රෝහල් කාණ්ඩය යටතේ නැවත වර්ගීකරණය කිරීමට අමාත්‍යාංශය තීරණයක් ගෙන තිබේ. තවද, මෙම රෝහල ස්වාධීන ආයතනයක් ලෙස 2019.09.01 දින සිට ක්‍රියාත්මක වනු ඇත.

ආයතනය පිළිබඳ අනෙකුත් තොරතුරු පහත සඳහන් වේ.

1. ආයතනයේ නම :- කේතුමතී කාන්තා රෝහල, පානදුර
2. පරිපාලන දිස්ත්‍රික්කය :- කළුතර
3. ඡන්ද කොට්ඨාශය :- පානදුර
4. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :- පානදුර
5. ආසන්නතම පරිපාලන කාර්යාලය :- කේතුමතී කාන්තා රෝහල
6. ආයතනභාර නිළධාරි :- වෛද්‍ය අධිකාරි (නියෝජ්‍ය පරිපාලන ශ්‍රේණිය)
7. වාර්තා කළයුතු නිළධාරියා:- ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ- කළුතර
8. තැපැල් හා විදුලි ලිපි කාර්යාලය:- පානදුර
9. ආසන්නතම දුම්රිය ස්ථානය :- පානදුර
10. පොලිස් ස්ථානය :- පානදුර

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

වෛද්‍ය අනිල් ජාසිංහ
**සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්**

**පිටපත් :**

1. ගරු ආණ්ඩුකාර, බස්නාහිර පළාත - ඔබගේ දැන ගැනීම සඳහා
2. පළාත් සෞඛ්‍ය ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය, බස්නාහිර පළාත - ඔබගේ දැනගැනීමට සහ අවශ්‍ය කටයුතු සඳහා
3. සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ සියළුම අතිරේක ලේකම්වරුන් - ඔබගේ දැන ගැනීම සඳහා